ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම - 2023

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගමේ (“සමාගම”) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ දේපල පිරියත සහ උපකරණ ප්‍රතිපත්තිය වනුයේ සියලුම ස්ථාවර වත්කම් මිලදී ගැනීම් ආරම්භයේදි ප්‍රාග්ධන නොනිම් වැඩ ගිණුමේ සටහන් කර වර්ෂයේ සෑම කාර්තුවක් අවසානයේදිම එම වත්කම් ප්‍රාග්ධනීකරණය කිරීමයි. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 දිනට දිගුකාලිනව ප්‍රාග්ධනීකරණය නොකළ නොනිම් වැඩ අගය රුපියල් මිලියන 126.92 ක් සමාගමේ ප්‍රාග්ධන නොනිම් වැඩ ගිණුම්වල ඇතුළත් වේ. | කළමනාකාරිත්වය අදහස් දක්වා නොතිබුණි. | දේපල පිරියත සහ උපකරණ ප්‍රාග්ධනීකරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු අතර එය ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල විය යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2015 මැයි 25 දිනැති අංක 01/2015 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2022 ජනවාරි 14 දිනැති අංක 01/2015 (ii) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන මෙහෙයුම් නිලධාරි සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද තනතුරක් දරන සහ ඕනෑම රාජ්‍ය ව්‍යවසායක (SOE) HM 1-1 කාණ්ඩයට සමාන හෝ ඉහළින් ස්ථානගත කර ඇති ඕනෑම නිලධාරියෙකුට පිළිවෙලින් මසකට ලීටර් 145 සහ 115 ට සමාන ඉන්ධන දීමනාවක් හිමිවේ. කෙසේ වෙතත්, සමාගම විසින් සේවකයින් හත් දෙනෙකු සඳහා ඉහත ඉන්ධන සීමාව ඉක්මවා ලීටර් 200 සිට ලීටර් 600 දක්වා මාසික ඉන්ධන දීමනාවක් ලබා දී තිබුණි. ඒ අනුව එම නිලධාරීන් සඳහා රුපියල් මිලියන 1.75 ක වැඩිපුර ඉන්ධන දීමනා ගෙවීමක් සිදුකර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ ඉන්ධන දීමනාව සඳහා සුදුසුකම් නොලබන | ඉන්ධන දීමනාව පදනම් වී ඇත්තේ සේවකයින්ගේ රැකියා කාණ්ඩය, ඉටු කරන ලද කාර්යභාරය/ආශ්‍රිත රාජකාරිය මත ය. සමාගමේ මෙහෙයුම් ආකෘතියට අනුව කාර්ය මණ්ඩලයට ගමන් කිරීම අවශ්‍ය වේ. මෙම පරිචය ෂෙල් කළමනාකරණය සිට භාවිත කරන ලදී. . ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත කර ඇති හෙයින් එහි තීරණ ගනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බව සඳහන් කිරීම උචිතය . | අධ්‍යක්ෂ මණ්ඩලය මේ සම්බන්ධයෙන් අදාළ නීති සහ රෙගුලාසි පිළිපැදිය යුතු අතර අවශ්‍ය ඕනෑම වෙනස් කිරීමක් සඳහා මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | සේවකයකු හට සමාගම විසින් රුපියල් 301,648 ක් ගෙවා තිබුණි. | | |
| (ආ) 2015 මැයි 25 දිනැති අංක 01/2015 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2016 ඔක්තෝබර් 27 දිනැති 01/2015 (i) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | නිල වාහනයකට හිමිකම් ඇති නිලධාරියෙකු හට නිල වාහනය භාවිතා කිරීමට හෝ රු. 50,000 ක මාසික ප්‍රවාහන දීමනාවක් සහ තනතුරට අදාළ මාසික ඉන්ධන දීමනාව ලබා ගැනීම යන විකල්පයන් පවතී. කෙසේ වෙතත්, එවැනි නිලධාරීන්ට රියදුරෙකු හෝ රියදුරු දීමනාවක් ලබා නොදිය යුතු වේ.<br>චක්‍රලේඛවලට පටහැනිව, | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව රැකියා කාණ්ඩය සහ අදාළ රාජකාරිය අනුව වාහන දීමනාව සහ ඉන්ධන වෙන් කිරීම සිදු කෙරේ. මෙය අනුගමනය කළ මූලාකෘතිය වන අතර, උද්ධමනය සඳහා සංශෝධනය සිදුකර ඇත. | අධ්‍යක්ෂ මණ්ඩලය මේ සම්බන්ධයෙන් අදාළ නීති සහ රෙගුලාසි පිළිපැදිය යුතු අතර අවශ්‍ය ඕනෑම වෙනස් කිරීමක් සඳහා මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුවේ. |
| | (i.) සමාගම විසින් රු. 171,600 සිට රු. 360,360 දක්වා පරාසයක මාසික ප්‍රවාහන දීමනාවක් සේවකයින් හත් දෙනෙකු සඳහා ගෙවා ඇති අතර, සමාලෝචිත වර්ෂය තුළ රුපියල් මිලියන 15.36 ක් වැඩිපුරද ගෙවා තිබුණි .තවද ඉහත සඳහන් නිලධාරීන්ගෙන් දෙදෙනෙකු සඳහා මාසික රියදුරු දීමනාව ලෙස රුපියල් මිලියන 0.6 ක් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණි. | රැකියා ආශ්‍රිත වාහන අවශ්‍ය සේවකයින් කිහිප දෙනෙකු සඳහා සමාගම නඩත්තු කරන වාහන ඉන්ධන ප්‍රතිපාදන සහිතව සමාගම සතු වාහන ලබා ගැනීමේ හැකියාව මත සපයා ඇත. මෙම සේවකයන් හට ප්‍රවාහන දීමනාවක් ලබාදී නොමැත.<br>සමාගමේ මෙහෙයුම් සිදු කිරීම සඳහා එදිනෙදා මෙහෙයුම් කටයුතු සිදු කිරීමට වාහන සැපයීම ඉතා වැදගත් වේ. | අධ්‍යක්ෂ මණ්ඩලය මේ සම්බන්ධයෙන් අදාළ නීති සහ රෙගුලාසි පිළිපැදිය යුතු අතර අවශ්‍ය ඕනෑම වෙනස් කිරීමක් සඳහා මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුවේ. |
| | (ii.) සමාගම විසින් ප්‍රවාහන දීමනාව සඳහා සුදුසුකම් නොලබන සේවකයින් දස දෙනෙකු සඳහා මාසික ප්‍රවාහන දීමනාව ලෙස රුපියල් මිලියන 6.09 ක් සමාලෝචිත වර්ෂය තුළ ලබා දී තිබුණි | ප්‍රවාහන දීමනා රැකියා කාණ්ඩය සහ වාහනවල වෙළඳපල මිල මත පදනම් වේ. මෙම පරිචය ෂෙල් කළමනාකාරිත්වයේ සිට භාවිතා කරන ලදී.<br>ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත කර ඇති හෙයින් එහි තීරණ ගනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බව සඳහන් කිරීම උචිතය . | අධ්‍යක්ෂ මණ්ඩලය මේ සම්බන්ධයෙන් අදාළ නීති සහ රෙගුලාසි පිළිපැදිය යුතු අතර අවශ්‍ය ඕනෑම වෙනස් කිරීමක් සඳහා මුදල් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2015 මැයි 25 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | මෙම චක්‍රලේඛයට පටහැනිව සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද වලංගු ප්‍රතිපත්ති ලේඛනයක් නොමැතිව, සමාගම 2020 වසරේ සිට වසර දෙකකට වරක් සේවකයින් සඳහා ජංගම දුරකථන මිලදී ගැනීමේ පිරිවැය ප්‍රතිපූරණය කරනු ලැබ ඇත. සමාගම 2023 වර්ෂයේදී ජංගම දුරකථන හතක් මිලදී ගැනීම සඳහා රු .400,000 ක් පමණ වැය කර තිබුණි. | කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ කාර්යභාරය ඉටු කිරීමට ජංගම දුරකථන සැපයේ . කාර්ය මණ්ඩල සාමාජිකයා විසින් ඉටු කරන රැකියා භූමිකාව පදනම් කර ගෙන කාර්යභාර ප්‍රධානියා විසින් අවශ්‍යතාවය නිර්දේශ කරනු ලබන අතර, මානව සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ඒවා නිකුත් කරනු ලැබේමෙම . යෙදුම් සඳහා ප්‍රවේශ වීමට, ජංගම දුරකථනය Android හෝ IOS ජංගම උපකරණයක් විය යුතුවේ . අනාගතයේදී අප විසින් අන්තර්ජාල අවකාශ පදනම් කරගත් (Cloud native) යෙදුමක් සංවර්ධනය කිරීමට අපේක්ෂා කරනු ලබන අතර , එයටද ජංගම දුරකථන අවශ්‍ය වේ. ලිට්‍රෝ අපගේ මෙහෙයුම් පැය 12කට වැඩි වන අතර බොහෝ නිවාඩු දිනවලද ක්‍රියාත්මක වන බැවින් වැඩ නොකරන වේලාවන්හිදී නිවසේ සිට වැඩ කිරීමට එමගින් පහසුකම් සලසනු ලැබේ. | සමාගම අදාළ වන මාර්ගෝපදේශ පිළිපැදිය යුතු අතර අවශ්‍ය ඕනෑම වෙනස් කිරීමක් සඳහා මහා භාණ්ඩාගාරයෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුවේ. |
| (ඇ) 2020 ජනවාරි 27 දිනැති අංක 01/2020 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2015 ජූනි 17 දිනැති අංක 03/2015 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | විධායක නොවන අධ්‍යක්ෂවරයෙකුගේ උපරිම සහභාගි වීමේ දීමනාව රු. 12,500 ක් වන අතර ඔහුට හිමිවනුයේ සහභාගි වීමේ දීමනාව පමණි. කෙසේ වෙතත්, 2020 වසරේ සිට සමාගම විසින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු සඳහා රුපියල් 100,000 ක් බැගින් වූ මාසික ප්‍රවාහන දීමනාවක් ලබා දී ඇත. | මෙය සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ ඇත. | සමාගම අදාළ වන මාර්ගෝපදේශ පිළිපැදිය යුතු අතර අවශ්‍ය ඕනෑම වෙනස් කිරීමක් සඳහා මහා භාණ්ඩාගාරයෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ)2023 දෙසැම්බර් 11 දිනැති අංක 04/2023 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | 2022 මූල්‍ය වර්ෂය තුළ ලාභ උපයා ඇති සහ දිරි දීමනා ගෙවා ඇති වාණිජ සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම් සඳහා එක් සේවකයෙකුට හට රු. 20,000 ක ප්‍රසාද දීමනාවක් යෝජනා කළ හැකි වේ. කෙසේ වෙතත්, සමාගම විසින් එක් සේවකයෙකු සඳහා රු.100,000 ක් බැගින් වූ ප්‍රසාද දීමනාවක් ගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ වැඩිපුර ගෙවූ මුළු ප්‍රසාද දීමනා අගය රුපියල් මිලියන 1.36 ක් පමණ වේ . | ෂෙල් කාල සීමාවේ සිට වසර අවසාන ප්‍රසාද දීමනාව ගෙවා ඇති අතර 2022 වසර දක්වා එම මුදල රු.60,000 ක් වූ අතර එය සමාගමේ මූල්‍ය කාර්යසාධනය මත පදනම්ව 100,000 දක්වා ඉහළ නැංවීමට සමාලෝචිත වසර තුල අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත (අනුමැතින් දැනටමත් බෙදා හැර ඇත).<br>ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත කර ඇති හෙයින් එහි තීරණ ගනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බව සඳහන් කිරීම උචිතය . | සමාගම අදාළ වන මාර්ගෝපදේශ පිළිපැදිය යුතු අතර අවශ්‍ය ඕනෑම වෙනස් කිරීමක් සඳහා මහා භාණ්ඩාගාරයෙන් පූර්ව අනුමතිය ලබා ගත යුතුවේ. |
| (ඊ.)2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය, රජය සතු ව්‍යවසායන් (SOEs) සඳහා මෙහෙයුම් අත්පොතෙහි 3.1 වගන්තිය | රජය සතු සියලුම ව්‍යවසායන් (SOE), ඔවුන්ගේ සේවක සංඛ්‍යාව සහ වේතනය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතුය. කෙසේ වෙතත්, සමාගම මෙම අවශ්‍යතාවයට අනුකූල වී නොමැත. | ෂෙල් කළමනාකරණ කාලපරිච්ඡේදයේ සිට මෙම ව්‍යුහය සහ පදනම අඛණ්ඩව පවතී.<br>ඊට අමතරව, අප විසින් 2019 දෙසැම්බර් 14 සහ 2022 නොවැම්බර් 20 දිනැති ලිපි මගින් කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් දෙපාර්තමේන්තුව වෙත අදාළ විස්තර ඉදිරිපත් කර ඇත. | සමාගම විසින් ඔවුන්ගේ සේවක සංඛ්‍යාව සහ ඔවුන්ගේ වේතනය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමතිය ලබා ගත යුතුය. |
| (උ.)2022 අගෝස්තු 08 දිනැති අංක 04/2022 සහ 2024 පෙබරවාරි 28 දිනැති අංක 01/2024 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | ඉහත චක්‍රලේඛයට පටහැනිව, මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව සමාගමේ කාර්ය මණ්ඩලය සඳහා පොලී රහිත කාර්ය මණ්ඩල සහන ණය ප්‍රතිපත්තිය 2018 මැයි 01 දින සිට අනුමත කර ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය නියම කර තිබූ අතර, 2022 සහ 2023 වර්ෂවලදී සංශෝධනය කර ඇත. තවද සමාගම විසින් නිවාස ණය ලෙස හඳුන්වා දුන් නව කාර්ය මණ්ඩල සහන ණය කාණ්ඩයක් හඳුන්වා දී ඇති අතර මිලියන 1.7ක් 2023 වසර තුළදී ප්‍රදානය කරනු ලැබ ඇත. | සමාගමේ සාමාන්‍ය පරිචයට අනුව, සමාගම් ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගනු නොලැබේ. දැනටමත් ඉහත සඳහන් කර ඇති සියලුම පිරිවැය ඇතුළත් සමාගමේ වාර්ෂික අයවැය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. | නව දීමනා සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමතිය ලබා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 1,540.4 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. මිලියන 582.4 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 958 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය සඳහා ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම් වලින් ආදායම රු. මිලියන 554.7 කින් වැඩිවීම හා මූල්‍ය ආදායම රු. මිලියන 474.1 කින් වැඩිවීම මෙම වර්ධනයට හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන් පෙර වර්ෂ පහක් (05) හා සසදා විශ්ලේෂණය කර වැඩිවීම් හෝ අඩුවීම්වල ප්‍රතිශතයන් ඇඟයීමට ලක්කර පහත පරිදි දක්වා ඇත.

| දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා | වටිනාකම රු. මිලියන | | | | | ප්‍රතිශත වෙනස % | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2023 | 2022 | 2021 | 2020 | 2019 | 2023 | 2022 | 2021 | 2020 | 2019 |
| ගනුදෙනුකරුවන් සමග එළඹෙන ගිවිසුම් වලින් ලද ආදායම | 1,999 | 1,444 | 1,616 | 1,508 | 2,064 | 38.4 | -10.6 | 7 | -27 | 1 |
| විකුණුම් පිරිවැය | 319 | 319 | 316 | 327 | 316 | 0 | 0.9 | -3 | 3 | -3 |
| මෙහෙයුම් ලාභය/ (අලාභය) | 1,169 | 656 | 924 | 918 | 1,748 | 78.2 | -29.0 | 1 | -47 | 3 |
| මූල්‍ය ආදයම් | 994 | 520 | 304 | 517 | 702 | 91.2 | 71.1 | -41 | -26 | 14 |
| මූල්‍ය වියදම් | 2.7 | 17.2 | 28 | 83 | 135 | 84.3 | -38.6 | -66 | -39 | - |

### 2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂ පහ (05) සමඟ සැසඳීමේ දී , ප්‍රධාන අනුපාත පහත දක්වා ඇති පරිදි වේ.

| වර්ෂය | 2023 | 2022 | 2021 | 2020 | 2019 |
|---|---|---|---|---|---|
| **අනුපාතය** | | | | | |
| ශුද්ධ ලාභ/(අලාභ) අනුපාතය (PBT) (%) | 108 | 80 | 76.04 | 95.19 | 104.22 |
| යෙදූ වූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය (ROCE) (%) | 16 | 9.60 | 9.60 | 12.27 | 18.47 |
| හිමිකම් මත ප්‍රතිලාභය (%) | 12.15 | 4.7 | 8.99 | 9.61 | 14.77 |
| වත්කම් මත ප්‍රතිලාභය (%) | 14.78 | 8.49 | 9.18 | 11.83 | 17.67 |
| වත්කම් පිරිවැටුම (වාර ගණන) | 13.67 | 10.42 | 15.27 | 23.43 | 43.92 |
| ජංගම අනුපාතය (වාර ගනන) | 5.60 | 1.14 | 4.81 | 13.15 | 14.21 |
| ක්ෂණික අනුපාතය (වාර ගනන) | 5.59 | 1.13 | 4.80 | 13.12 | 14.19 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් සඳහා පෙට්‍රෝලියම් ද්‍රව වායු තොග ගබඩා පහසුකම් සැපයීම සඳහා සමාගම පිහිටුවා ඇති අතර 2023 සහ 2022 වසර සඳහා පිළිවෙළින් සියයට 525 ක් සහ සියයට 352 ක් ලෙස සැලකිය යුතු ඉහළ දළ ලාභ ආන්තිකයක් (විකුණුම් පිරිවැය මත පදනම්ව) වාර්තා කර ඇත. පෙර වසරට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ දළ ලාභය රුපියල් මිලියන 554 කින් සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. 2019 ඔක්තෝබර් 28 වන දිනැති LGGTTL/AOB/03/OCTOBER/2019 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් තීරණය කරන ලද ගෑස් ටොන් එකකට ඇ.ඩො 51 ක ප්‍රතිදාන ගාස්තුව (Throughput fee) 2023 වර්ෂයේදී ඇ.ඩො 20 දක්වා අඩු කර තිබුණි. කෙසේ වෙතත්, ද්‍රව ගෑස් තොග ගබඩා පහසුකම් ගාස්තු තවදුරටත් අඩු කිරීම මගින් ලිට්‍රෝ ගෑස් ලංකා සමාගමේ මෙහෙයුම් පිරිවැය අඩු කිරීමට සහ ඒමගින් රටේ ගෑස් පාරිභෝගිකයාට සිදුවන අපහසුතාවයන් අවම කිරීමට සහාය වීම සඳහා ගෑස් මිල අඩු කිරීමට සමාගම විසින් පියවර ගෙන නොතිබුණි. | ලිට්‍රෝ ගෑස් ලංකා ලිමිටඩ් හි ප්‍රතිදාන ගාස්තුව (Throughput fee) අඩු කිරීම මගින් මෙහෙයුම් වියදම් අඩු කිරීමට සමාගම සැලකිය යුතු පියවර ගෙන ඇත. අප සමාගමේ දිගුකාලීන ශක්‍යතාව සහ මෙහෙයුම් විශිෂ්ටත්වය සහතික කරමින්, පිරිවැය අඩු කිරීම සහ ගනුදෙනුකරුවන්ගේ පහසුවට සහාය වන ක්‍රියාමාර්ග ඇගයීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා දිගින් දිගටම කටයුතු කරනු ලැබේ .නිෂ්පාදනයේ වර්තමාන වැඩිවන ඉල්ලුම සමඟ අඛණ්ඩ සැපයුමක් සහතික කිරීම සඳහා ගබඩා ධාරිතාව පුළුල් කළ යුතු බව ගම්‍යවේ.මේ සඳහා කළ යුතු ආයෝජනය සැලකිය යුතු අගයක් වේ . ඒබැවින් තවදුරටත් වියදම අඩු කර ගැනීමට යම් තීරණයක් ගැනීමට පෙර මෙම ගැටලුව විසඳා ගත යුතුවේ. | මෙහෙයුම් පිරිවැය අඩු කිරීම සඳහා මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සමාගම විසින් ගත යුතුවේ. |

### 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් 2021 වසරේදී ඔක්සිජන් පිරවුම්හලක් ඉදිකිරීම සඳහා සහ/හෝ අතිරේක ද්‍රව පෙට්‍රෝලියම් ගෑස් (LPG) මෙහෙයුම් සහ ගබඩා පුළුල් කිරීමේ ව්‍යාපෘතියක් හෝ වෙනත් අදාළ ක්‍රියාකාරකම් සඳහා භාවිතා කිරීමට කෙරවලපිටියේ අක්කර 22ක ඉඩමක් සහ ගොඩනැඟිල්ලක් සඳහා සම්පූර්ණ බදු දීමනාවෙන් කොටසක් ලෙස රුපියල් මිලියන 500ක් ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාවට ගෙවා තිබුණි. කෙසේ වෙතත්, සමාගමේ සිදුවෙමින් පවතින ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් ඉහත ඉඩම සමාගමට බදු දීමට ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාවට කැබිනට් අනුමැතිය සමාලෝචිත වර්ෂය දක්වා ලබා දී නොතිබුණි. එබැවින් ඉහත ගෙවීමෙන් සමාගම මේ දක්වා කිසිදු ප්‍රතිලාභයක් ලබාගෙන නොතිබුණි. | ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව (SLLDC) වෙත ගෙවීම සිදු කරන ලද්දේ සමාගමේ මෙහෙයුම් සඳහා අත්‍යවශ්‍ය උපාය මාර්ගික ව්‍යාපෘති සඳහා ඉඩම සුරක්ෂිත කර ගැනීමේ අදහසිනි. සිදුවෙමින් පවතින ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් කැබිනට් අනුමැතිය ප්‍රමාද වුවද, ඉඩම සඳහා කල්බද්ද සුරක්ෂිත කර සමාගමට අපේක්ෂිත ප්‍රතිලාභ ලැබෙන බවට සහතික කිරීමට පියවර ගෙන ඇත. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව (SLLDC) සහ මුදල් අමාත්‍යාංශය සමඟ අඛණ්ඩ සන්නිවේදනය සහ සාකච්ඡා සමඟින් තත්ත්වය සක්‍රීයව කළමනාකරණය කරනු ලැබ ඇත. මීට අමතරව, මෙම පහසුකම් තුළ ස්ථානගත කිරීමට නියමිත සමාගමේ අනෙකුත් පහසුකම්වල නව සැලසුම් ක්‍රියාත්මක වෙමින් පවතී. එය අවසන් කර අනුමත වූ පසු එහි විස්තරය සපයනු ලැබේ. | අදාළ බලධාරීන්ගේ අනුමැතිය ඇතිව සමාගම විසින් මෙම දේපල අපේක්ෂිත අරමුණ සඳහා හෝ වෙනත් සුදුසු කටයුත්තක් සඳහා භාවිතා කළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල, මාර්ගෝපදේශ 4.2.2 සහ 4.2.3 හි සඳහන් උපදෙස් සහ ප්‍රසම්පාදන සංග්‍රහයේ අදාළ ව්‍යුහයට අනුව, ප්‍රසම්පාදන සැලැස්ම හරහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රසම්පාදන ආයතනයක් සූදානම් කළ යුතුය. තවද, එක් එක් තනි ප්‍රසම්පාදන ක්‍රියාව ආරම්භයේ සිට එය අවසන් වන තෙක් කාලානුක්‍රමික අනුපිළිවෙලින් විස්තර කරමින් ප්‍රසම්පාදන කාලසටහනක් සකස් කළ යුතුය. කෙසේ වෙතත්, ඉහත මාර්ගෝපදේශයන්ට අනුකූලව සමාගම විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සහ ප්‍රසම්පාදන කාලසටහනක් සකස් කර නොතිබුණි. | රුපියල් මිලියන 50 කට වැඩි වටිනාකමකින් යුත් (දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු විශාල කොන්ත්‍රාත්) (DPC major) ප්‍රසම්පාදන සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සහ කාලසටහන රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. ආයතනය වෙළඳපල මිල සැඳහුම් මට්ටමේ ප්‍රසම්පාදන සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කරනු නොලැබේ. | සමාගම විසින් එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර විස්තර කෙරෙන කාලානුක්‍රමික අනුපිළිවෙලින් ප්‍රසම්පාදන කාලසටහන සකස් කළ යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගමේ (LGTLL) , මුළු වත්කම් වලින් 41% ක් නියෝජනය කරනු ලබනුයේ දේපල පිරියත සහ උපකරණ මගින් වන අතර එහි පොත් වටිනාකම රු. බිලියන 6.96 ක් සහ ශුද්ධ වටිනාකම රු. බිලියන 5.98 ක් පමණ වේ. නමුත් සමාගම විසින් 2023 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්වල භෞතික පැවැත්ම තහවුරු කර ගැනිම සඳහා වත්කම් සත්‍යාපනයක් හෝ භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි. | ශක්තිමත් වත්කම් කළමනාකරණ පද්ධතියක් සහතික කිරීම සඳහා සමාගම විසින් වාර්ෂික වත්කම් සත්‍යාපනයක් ක්‍රියාත්මක කළ යුතුවේ. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රේඛීය අමාත්‍යාංශය විසින් නම් කරන ලද සභාපතිවරයා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ (මව් සමාගම) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කර ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 වර්ෂයේදී ඔහුව ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් ද පත් කර තිබුණි. 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යවසාය සඳහා වූ ආයතනික යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ වල (Corporate Governance for State Owned Enterprises) 2.2.2 | එම් එස් ජී පීරිස් මහතා ලිට්‍රෝ ගෑස් ටර්මිනල් ලංකා (පුද්ගලික) සමාගමෙහි (LGTLL) සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී යන දෙඅංශයෙන්ම පත් කිරීමට ගත් තීරණය හදිසි මෙහෙයුම් අර්බුදයකට විසඳුම් සෙවීමේ අවශ්‍යතාවය මත සිදු වූ අතර එය සමාගමේ සහ ජාතියේ යහපත උදෙසා ගනු ලැබීය. ස්වාධීන | සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී යන ප්‍රබල ගැටුම්කාරී භූමිකාවන් දෙක වෙන් කිරීම නිර්දේශ කෙරේ. |

| | | |
|---|---|---|
| මාර්ගෝපදේශයට අනුව, සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධානියා වන අතර මාර්ගෝපදේශ 2.5.1 අනුව ප්‍රධාන විධායක නිලධාරියාගේ වගකීම වන්නේ උපායමාර්ගික, උපායශීලී සහ මෙහෙයුම් සැලසුම් සකස් කිරීම වේ. මෙම තනතුරු දෙකේහිම රාජකාරි එකම පුද්ගලයෙක් විසින් ඉටු කිරීම යහපාලන භාවිතයන්ට පටහැනිය. | විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු සිටීම යහපාලන ප්‍රමිතීන් පවත්වාගෙන යාමට අපගේ කැපවීම තවදුරටත් ශක්තිමත් කරනු ලැබේ. | |

## 4.2 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණන කමිටුව අවම වශයෙන් මාස තුනකට වරක් රැස්වී එහි නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ සමාගම සඳහා එක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. | අවම අවශ්‍යතාවය සපුරා නොතිබුණද, 2023 වර්ෂය තුළදී විගණන සැලැස්ම ආවරණය කිරීමට අවධානය යොමු කොට එය ඉටු කරගනු ලැබීය. කෙසේ වෙතත්, අවම වශයෙන් විගණන කමිටු රැස්වීම් හතරක් පැවැත්වීමේ අවශ්‍යතාවය 2024 වර්ෂය තුළ සම්පූර්ණ කරනු ඇත. | විගණන කමිටුව ක්‍රමවත්ව රැස්විය යුතු අතර සමාගමේ මූල්‍ය කාර්යය සහ අනෙකුත් අදාළ කරුණු නිරීක්ෂණය කළ යුතුය. |